# 3 ශ්‍රේණිය සිංහල
# ගුරු අත් පොතට
# වැඩ පොත - අංක 11

## L8, S8, R8, W8

## නිපුණතා ආවරණය - 2021



- ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.


සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



For Online Class details WhatsApp 071-9020298

# 3 ශ්‍රේණිය මව්බස (සිංහල)
# $L_8$ $S_8$ $R_8$ $W_8$ ඉගෙනුම් පළ

- ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන් දෙයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි.
- ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.

## චාරිකා

- පහත සඳහන් ස්ථානවලින් සුදුසු ස්ථානයක් තෝරාගෙන අධ්‍යාපන චාරිකාවක්/ක්ෂේත්‍ර චාරිකාවක් යැමට සංවිධානය කර ගන්න. එසේ නොමැති නම් වීඩියෝ පට/පින්තූර යොදා ගනිමින් චාරිකාවක අත්දැකීම් ලබා ගැනීමට කටයුතු කරන්න.

උදා : කර්මාන්ත ශාලාවක්, ගොවිපළක්, ග්‍රහලෝකාගාරය, කෞතුකාගාරය, සතුන්වත්ත, දිය ඇල්ලක්, උද්‍යානයක්

### චාරිකාවේ වාර්තාව

චාරිකාව යාම සඳහා අපි සියලු දෙනා පෙරවරු 7.30ට පාසලට රැස් වුණෙමු. විදුහල්පතිතුමා චාරිකාවේ දී හැසිරිය යුතු ආකාරය පිළිබඳ අපට උපදෙස් දුන්නේ ය. අපි සියලු දෙනා එක පෙළට ගොස් බස්රථවලට ගොඩ වුණෙමු. දෙහිවල සතුන් වත්ත නැරඹීම සඳහා අපි පෙ.ව. 8.00ට පාසලෙන් පිටත් වුණෙමු. පෙ.ව.9.00 පමණ වන විට අපි දෙහිවල සතුන් වත්ත අසලට පැමිණියෙමු. චාරිකාවට සහභාගි වූ සිසුන් සඳහා සතුන් වත්ත නැරඹීමට ප්‍රවේශ පත්‍ර ලබාගත යුතු විය. එහි ගේට්ටුව අසල ම සතුන් වත්ත නැරඹිය යුතු ගමන් මඟ සටහන් කළ පුවරුවක් තිබිණි. එම අංක අනුපිළිවෙළට අප සතුන් වත්ත නැරඹිය යුතු බව ගුරුතුමිය කීවා ය.

මීන් මැදුර, කුරුලු උයන, සමනළ උයන යනාදිය නැරඹූ අතර ම සිංහයා, කොටියා, වලහා, අශ්වයා, ජිරාෆ් වැනි සතුන් ද, කුරුල්ලන් ද, උරගයන් ද අපි දුටුවෙමු. අපි දිවා ආහාරය ගැනීමට එහි සකස් කර ඇති උද්‍යානයට ගියෙමු. සවස් වරුවේ අපි අලි සෙල්ලම් බලා බොහෝ සතුටු වුණෙමු. සතුන් වත්ත නැරඹීම අවසන් වන විට ප.ව.5.30 පමණ විය. ආපසු පාසලට පැමිණීම සඳහා අපි බසයට ගොඩ වුණෙමු.

1. චාරිකාව ගියේ කොහේට ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

2. සහභාගි වූයේ කවුරුන් ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

3. චාරිකාව යැමට පාසලෙන් පිටත් වූයේ කුමන වේලාවක ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

4. ඔබ සතුන් වත්තේ දී නැරඹූ ස්ථාන දෙකක් නම් කරන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

5. ඔබ සතුන් වත්තේ දී දුටු සතුන් තුන් දෙනෙක් නම් කරන්න.

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

6. සතුන් වත්ත නැරඹීම අවසන් කළේ කීයට ද ?

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## නිර්මාණ - දෙබස්

- මිතුරෙකු/ මිතුරියක සමඟ පහත සඳහන් දෙබස රඟ දක්වා එයට සවන් දෙන්න.



දෙබස

සහන් - යාළුවේ, යාළුවේ

පඹයා - ඇයි සහන් ?

සහන් - මට ඔයා ගැන දුක යි

පඹයා - ඒ ඇයි සහන් ?

සහන් - ඔයා හැමදා ම මහ අව්වේ වේලෙනවා. වැස්සට තෙමෙනවා.

පඹයා - මං ඔයාගේ තාත්තගේ ගොයම් බලා ගන්නව නේ.

සහන් - හෙට ගොයම් කපනව නේ.

පඹයා - එහෙනම් මට හෙට ගෙදර යන්න පුළුවනි.

සහන් - ඔයා යමු අපේ ගෙදර

පඹයා - තාත්තාගෙන් අහන්නකෝ . . .

සහන් - තාත්තා එපා කියන්නේ නැහැ. ඔයා මගෙ යාළුව නේ . . .

පඹයා - එහෙනම් අපිට හෙට ඉඳලා සෙල්ලම් කරන්න පුළුවනි. ඔයා හරි හොඳ යහළුවෙක්.

- ඉහත දෙබස උදාහරණයට ගෙන දී ඇති පින්තූර වලට අදාළ ව නිර්මාණශීලීව දෙබස් ලියන්න. එහිදී පහත කරුණු කෙරෙහි සැලකිලිමත් වෙන්න.
  - ➢ කතා කරන බසින් ලිවීම
  - ➢ ප්‍රශ්නෝත්තර ක්‍රමයට ලිවීම
  - ➢ නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීම
  - ➢ දෙබසෙහි නිශ්චිත අවසානයක් තිබීම





**ළමයා හා ලේනා**

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................





**හාවා හා කොකා**

## කූඹියා හා වේයා









**ගොළුබෙල්ලා හා ළමයා**

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

## පුස්තකාල භාවිතය

- පොත් කියවීම සඳහා පාසල් පුස්තකාලයට යෑමට සූදානම් වන්න. (පාසල් පුස්තකාලයක් නොමැති නම් පන්ති පුස්තකාලයක් සකස් කර ගන්න.)
- පුස්තකාලයට ගොස් පොතක් හෝ තෝරා ගෙන කියවන්න. පොත කියවා අවසානයේ පහත සඳහන් පැවරුමට පිළිතුරු ලියන්න.

  ➢ පොතේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

  ➢ කතුවරයාගේ නම : . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

  ➢ කියවූ කතන්දර පොතේ සිත් ගත් අවස්ථාවක් නම් කරන්න

  . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

  . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

  . . . . . . . . .. . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .

# <u>පුනරීක්ෂණ</u>



ඇත්ත වශයෙන් ම ටික වේලාවකින් තුරු හිස් අතරින් මතු වූයේ සඳ මඩල ය. එය කෙමෙන් ගුවනට නැග ගෙන, පඩුවන් සිසිල් රැස් වනය මත හෙළිය. සඳ කැලුමින් නැහැවී ගිය වනය, වැණිය නො හැකි සුන්දරත්වයකින් හෙබවිණි. අතු - රිකිලිවලින් පෙරී ආ රැස් දහරින් වනය මැදට ද මඳ වශයෙන් එළිය වැටිණ. උස් තැනක සිටි අපට, වනය වඩාත් කමනීය ලෙස දිස් විය. සඳ රැස් පහස ලැබ ඔප් නැගුණු පත් රිකිලි ලෙළ දුන් විට, වනය දෙව් අරමක් මෙන් බැබළිණ.

සඳ එළියෙන් අඳුර තුනී වී ගිය බැවින් සිතට ද සැහැල්ලු බවක් දැනෙයි. සඳ, එළියක් ගෙන අපේ තනියට ආ කිසිවකු මෙනි. ගන අඳුරේ වන සතුන් මැද පිළිසරණක් නැති ව සිටි අපට සරණ වීමට පැමිණි සඳ මඬල, අප සමග එක්තරා සුහදතාවකින් බැඳුණා සේ අපට හැගෙයි.

**අභ්‍යාස I**

(1) තුරු හිස් අතරින් මතු වූයේ කුමක්ද? ..............................................................

(2) වනයට සුන්දරත්වයක් ලැබුණේ කෙසේද? ..............................................................

(3) ඔවුන්ට, වනය වඩාත් කමනීය ලෙස දිස් වූයේ කෙසේද? ..............................................

(4) වනය බැබළුණේ කුමක් ලෙසද? ..............................................................

(5) අඳුර තුනී වී ගියේ කෙසේද? ..............................................................

(6) ඡේදයේ සඳහන් යුගල පදයක් සොයා ලියන්න. ..............................................

**වනගත ළමෝ**

| | | | |
|---|---|---|---|
| 1 වේ | 2 | (shaded) | 3 සෙ |
| (shaded) | ර | (shaded) | |
| 4 අ | | (shaded) | |
| | (shaded) | 5 ම | |

**අභ්‍යාස II**

**මේවාට සමානාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.**

(1) ගස් - ..............................................................

(2) චන්ද්‍රයා - ..............................................................

(3) අහසට - ..............................................................

(4) අන්ධකාරය - ..............................................................

**මේවාට විරුද්ධාර්ථ පද ඡේදයෙන් සොයා ලියන්න.**

(1) අඳුර - ..............................................................

(2) මිටි - ..............................................................

(3) බර - ..............................................................

**හරහට**

1. තුඹසේ නිර්මාතෘ වේ.

4. පාර්ලිමේන්තුවේ දී .......... වැය වාර්තාව ඉදිරිපත් කෙරේ.

5. අම්මට සමාන පදයකි.

**පහළට**

2. රෙදි මනින මිම්මකි.

3. තෙල් සිඳීමට යොදාගත් උපකරණයකි.

4. දහයට අඩු ඉරට්ටේ සංඛ්‍යාවකි.